# ඇදුරුතුමියයි ඇය මගේ



බිනාරා රනුදිමා සෙනෙවිනායක

ඇදුරුතුමියයි ඇය මගේ

බිනාරා රනුදිමා සෙනෙවිනායක

කතෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය - 2023

# පිදුම

පියදස්සී විදු මැණියන්ට සමු දී

අකුරු කරන්නට

මහාමායා විදුමැණියන් වෙත

පියනැගූ මා හට

සිප්සතර කියාදුන්

මගේ සදාදරණීය

අමිතා කුමාරි හේරත් ගුරු මැණියන්ට

හද බැතියෙන් පුදමි....



මනහර වැවකි ගම් මැද්දේ සිසිල   දෙන
කෙත්වතු දිලෙයි ලානිල් පැහැයෙන්   තුටින
ගමයි පන්සලයි දාගැබ නෙත   ගැටෙන
අයියතිගේ වැවයි මගෙ ගම රජ   රටින

කල්වැසි වසින වැව් දිය පුරවා   දමන
කෙත්වතු සරුකරයි ලානිල් පැහැය   ගෙන
සිතට අම සුවය ගත ඩා දුක්   නිවන
මෙමට තව ගමක් මේ සරි ලොව   දකින



සියපත් පුබුදුවන හිමිදිරි උදෑසන
ලා හිරු කිරණ වැටුනු වැව් දිය මතින
දළදා සමිඳු නිරතුරු වැඳ පුදාගෙන
විදුමව් වෙතට ආවේ මම උදෑසන

සිප් සයුරෙහි දැරියන් සැම ගිල්වන්ට
අපමන වෙහෙස වුනු ආදර ගුරුමව්ට
වදන් නොමැත ඒ ගැන මට පවසන්ට
දිරියෙන් අකුරු උගනෙමි මා යමි පෙරට

සිප් කිරි පෙව්වෙ ගුරුමව් ලෙස ඔබ මාගේ
කුසගිනි නිව්වේ වැදුමව් ලෙස ඔබ මාගේ
ඔබේ දෙපා ලග තබනෙමි හිස මාගේ
කප් රුක නුබයි සිසු දිවියේ නුබ මාගේ

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට

පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01